# ගොවි දැනට සවිය ගොවිජන සේවාව

**ගොවි ජනතාවට සේවය කිරීමට බැඳී සිටින ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව වසර 36 ක් තිස්සේ තම වගකීම් කොටස ඉටු කරමින් සිටියි. ගොවියා සමග සමීපව කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව ගොවිජන සේවා මධ්‍යස්ථාන 540 ක් මාර්ගයෙන් බල ප්‍රදේශයේ ගොවීන් සමග, සහයෝගයෙන් කටයුතු කිරීමට විවිධ වැඩ සටහන් කාලානුරූපව දියත් කොට තිබේ.**

දැනට ක්‍රියාත්මක වන වැඩසටහන් කීහිපයක් සාකච්ඡා කිරීම මෙහි අරමුණ වන අතර, ඒවා ක්‍රියාත්මක කිරීමේ දී මතු වූ ප්‍රායෝගික ගැටළු ගැනත් සඳහන් කිරීම ප්‍රයෝජනවත් යැයි සිතමි.

ගොවිජන සේවා පනතින් පැවරී තිබෙන වගකීම් වලට අමතරව, දෙපාර්තමේන්තුව ආයතනික සංවර්ධනය මුල් කරගත් ගොවි සංවිධාන වැඩ සටහන දීප ව්‍යාප්තව කරගෙන යෑමට සහාය දෙන අතර, ගොවීන්ට ප්‍රයෝජනවත් කාලීන තාක්ෂණික දැනුම, උපදෙස්, පුහුණු වැඩසටහන් මාර්ගයෙන් ලබාදීමේ වැඩ පිළිවෙලක්ද දියත් කොට තිබේ.

දශක 3 කට අධික කාලයක් ගොවියා සමග සමීප සබඳකමක් පවත්වා ගෙන යන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විවිධ ක්‍රමෝපායන් ප්‍රයෝජනයට ගනිමින් ගොවියාට සංවිධානාත්මක ශක්තියක් ලබාදීමට පියවර ගෙන තිබේ. 1980 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවට ආහාර හා කෘෂිකර්ම සංවිධානය හඳුන්වා දුන් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය යටතේ මෙරට ජීවත් වන සුළු ගොවියා සංවිධානය කිරීමට ගත් ප්‍රයත්නය සඳහන් කළ හැක.

මුලින් සඳහන් කළ පරිදි ආයතනික සංවර්ධනයට දෙපාර්තමේන්තුව හවුල් වූයේ අද ඊයේ නොවේ. කලින් කලට ගෙන ගිය අත්හද බැලීම් ප්‍රයෝජනයට ගෙන, අලුත් දෙයක් ගොවි ජනතාවට ඉදිරිපත් කිරීමට ගත් උත්සාහයක ප්‍රතිඵල අද අප හමුවේ දක්නට තිබේ.

දෙපාර්තමේන්තුවේ ජාතික වැඩ සටහනක් වශයෙන් 1979 සිට ක්‍රියාත්මකවූ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ ගොවීන් සංවිධානය කර ඔවුන් සුළු වාරිමාර්ග නඩත්තු හා මෙහෙයුම් කටයුතු කෙරේ යොමු කරවීම සඳහා වැව් කමිටු, අමුනු කමිටු ක්‍රියත්මක කරවීම ආරම්භ කර දැනට දශකයකට ආසන්න කාලයක් ගත වී තිබේ. එකල දැන් මෙන් පැහැදිලි නීතිමය අවරණයක් නොතිබුණ ද සමාජ රීති හා සම්මුති ආශ්‍රයෙන් ද දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම මත ද මේවායේ ක්‍රියාකාරීත්වය සිදුවුනි. වර්තමාන තත්ත්වයන්ට ගැලපෙන පරිදි ගොවියාට ඔහුගේම ශක්තිමත්, නීත්‍යානුකූල සංවිධානයක් ගොඩනගා ගැනීමට මග පෙන්වීමක් වශයෙන් 1991 අංක 4 දරන සංශෝධිත ගොවි ජන සේවා පනතේ 56 "අ" යටතේ ගොවි සංවිධාන පිහිටුවා ගැනීමට අවසර දී තිබේ.

**මෙම සංවිධානවල සාමාජිකත්වය හිමි වන්නේ කාටද?**

සංවිධාන කිරීමට අවශ්‍ය දෙපාර්තමේන්තුව ඇති ප්‍රදේශයේ කුඹුරු හිමි ගොවීන් හෝ අඳ ගොවීන්ට හෝ වෙනත් කෘෂිකාර්මික ගොවි තැනක් හෝ කෘෂිකාර්මික කටයුත්තක යෙදුණු ගොවීන්ට සංවිධානයක් පිහිටුවා ගත හැකිය. එවැනි සංවිධානයක් ගොවිජන සේවා පනත අනුව ලියාපදිංචි වීමට යටත් පිරිසෙයින් ගොවියන් 25 ක් වත් අවශ්‍ය ය.

දෙපාර්තමේන්තුවේ ආදර්ශ අතුරු ව්‍යවස්ථාවක් ගොවි සංවිධානවලට ලබා දී ඇති අතර, ඉහත කී ගොවීන් පිරිස එම ව්‍යවස්ථාව සභා සම්මත කර ගෙන සාමාජික නාම ලේඛනය ද සමග ඉදිරිපත් කළ විට ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ඇත.

මහා වාරිමාර්ග බල ප්‍රදේශවල වුව ද මෙවැනි සංවිධානයන් පිහිටුවා ගෙන ලියාපදිංචි කර ගැනීමට හැකිය. නමුත් එවැනි සංවිධානය ලියාපදිංචි කිරීමේ දී වාරිමාර්ග අමාත්‍යංශයේ ලේකම්ගේ එකඟත්වය ඊට ලබාගත යුතු ය.

**මෙසේ ලියාපදිංචි කරනු ලබන ගොවි සංවිධාන වල පරමාර්ථ අතරට ඇතුළත් කළ හැකි දෑ මෙසේ ය:**

i ප්‍රදේශය වෙනුවෙන් කෘෂිකාර්මික වැඩ සටහනක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ii ගම් මට්ටමේ ඉදිකිරීම් කරගෙන යෑම සහ වාරිමාර්ග අළුත්වැඩියා කිරීම

iii නිෂ්පාදන අලෙවි කිරීම බීජ බෙදා හැරීම, පොහොර සහ කෘෂි රසායන බෙදා හැරීම.

iv ගොවීන් සහ රජයේ සංවිධාන අතර, සහයෝගය වර්ධනය කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධීකරණය දියුණු කිරීම.

v ගොවිජන සේවා කොමසාරිස් වරයා විසින් ගොවි ජනතාවට හිතකර යැයි අනුමත කළ වෙනත් කාර්ය්‍ය වල නියැලීම.

56. අ. (1) සහ (2) උප වගන්තිවලට අනුකූලව පිහිටුවා ගත් ගොවි සංවිධානයකට 56 (ආ) යටතේ ලියාපදිංචි වීමට අවශ්‍ය නම් පහත දැක්වෙන කොන්දේසි පිළිබඳව සෑහීමකට පත් විය යුතු ය.

01. ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු නංවා ලීමට ක්‍රියාත්මක වීම හෝ එවැනි කටයුතු නංවාලීමට හැකියාවක් තිබීම

02. ප්‍රදේශයේ ගොවීන්ගේ විශ්වාසය සහ පැහැදීම දිනා සිටීම

03. ආර්ථික ශක්තිය සහ වාරිමාර්ග අළුත්වැඩියා භාර ගැනීමට මූල්‍ය සම්පත් හා අනිකුත් සම්පත් තිබීම.

56(ආ) යටතේ ලියාපදිංචි වූ ඕනෑම ගොවි සංවිධානයකට, සුළු වාරිමාර්ග ප්‍රදේශයකට හෝ මහා වාරිමාර්ග ප්‍රදේශයක හෝ වේවා ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හිමි නීතිමය බලතල හිමි වෙන අතර, සංවිධානයේ ලියාපදිංචි නම යටතේ නඩු කීමට සහ නඩු පැවරීමට අයිතියක් තිබේ

මීට අමතරව කෘෂිකාර්මික භාරකාර

අරමුදලින් ගොවීන්ට ණය නිකුත්කරනු ලබන්නේ ගොවි සංවිධාන හරහා වන අතර, ඒ සඳහා ගොවීන් සමග ගිවිසුම් වලට එළඹීමට ගොවි සංවිධාන වලට හැකිය. එසේ ණය ලබාගත් ගොවියෙක් ගිවිසුමේ ප්‍රකාර ණය ගෙවීම පැහැර හැරියොත් ඔහුට හෝ ඇයට විරුද්ධව නඩු පැවරීමේ අයිතිය 56 "ආ" වගන්තිය යටත් ලියාපදිංචි වූ ගොවි සංවිධානයට හිමි වේ.

දැනට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබාගත් ගොවි සංවිධාන සංඛ්‍යාව දස දහසකට ආසන්න ය. මීට මහා වාරිමාර්ග බල ප්‍රදේශවල ද ක්‍රියාත්මක වන සංවිධාන ඇතුලත්ව තිබේ. ක්ෂේත්‍ර මට්ටමේ ලියාපදිංචි කර ඇති මෙම ගොවි සංවිධාන වලින් ගොවීන් විසින් ම තෝරා ගත් ගොවි නියෝජිතයින් දහ දෙනෙක් සෑම ගොවිජන සේවා කමිටුවක් ම නියෝජනය කරන අතර, කමිටු සාමාජිකයින් 15 ක් වන මුලු ගණනින් 10 ක්ම ගොවීන් වීමෙන්, කෘෂිකර්මයට සම්බන්ධ තීරණ ගැනීම් වල දී ගොවීන්ට ප්‍රමුඛත්වය ලැබී තිබේ. ගොවි ජන සේවා කමිටුවක සිටින ගොවි නියෝජිතයින් දහ දෙනා අතුරින් හය දෙනෙක් එම ගොවීන් විසින්ම තෝරා දිස්ත්‍රික් බල මණ්ඩල ගොවි සංවිධානවල සාමාජිකයින් ලෙස පත්කර ගෙන දැනට දිස්ත්‍රික් ගොවි සංවිධාන 18 ක් දිවයින පුරා පිහිටුවා ඇත. මෙම සෑම දිස්ත්‍රික් ගොවි සංවිධානයකටම නිශ්චිත කාර්යයන්, අඩංගු අතුරු ව්‍යවස්ථාවක් මගින් ක්‍රියාත්මක වේ. මෙම සෑම දිස්ත්‍රික් ගොවි සංවිධාන වලට මහා වාරිමාර්ග හා මහවැලි බල ප්‍රදේශවල ගොවි නියෝජිතයින් ද සිටින අතර, සමහර දිස්ත්‍රික් ගොවි සංවිධානවල කමිටුවල වගකීව යුතු තනතුරු වලට පවා මහා වාරිමාර්ග ගොවීන් ද පත්වී ඇත. සාමූහිකව කිසිදු බේදයක් නොමැතිව ඔවුන් ඉතාම සහයෝගයෙන් කටයුතු කරන බව පෙනී ගොස් ඇත. මෙම දිස්ත්‍රික් ගොවි සංවිධාන ගොවිජන සේවා පනත යටතේ ලියාපදිංචි කර තිබේ. දිවයින පුරා පිහිටුවා ඇති ගොවිජන සේවා කමිටු මගින් පාලනය වන ගොවිජන සේවා මධ්‍යස්ථාන 540 න් තමාට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමට සෑම ගොවියෙකුටම අයිතියක් තිබෙනවා. මහවැලි ගොවියන් මහා වාරිමාර්ග ගොවියන් සුළු වාරිමාර්ග ගොවියන් ආදී වශයෙන් බෙද සේවා සැපයීම් කිරීමක් දෙපාර්තමේන්තුවේ නැත. දැනටමත් දෙපාර්තමේන්තුව මගින් රෝද දෙකේ ට්‍රැක්ටර් විශාල සංඛ්‍යාවක් මහා වාරිමාර්ග බල ප්‍රදේශවල තිබෙන ගොවි සංවිධානවලට ද අනිකුත් ගොවි සංවිධානවලට මෙන් ම සහන මිළට ලබාදී තිබේ.

කෙසේ වෙතත් ගොවි සංවිධාන සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ දෙපාර්තමේන්තු / අමාත්‍යංශවල නිලධාරීන් අතර, විශේෂයෙන්ම ක්ෂේත්‍ර නිලධාරීන් අතර මනා අවබෝධයක් සහ සහයෝගීතාවයකින් යුතුව ගොවි සංවිධානවලට යෝග්‍ය පොදු වැඩ පිළිවෙලක් සකස් කිරීමට හැකි නම් එය ඉතා අගනා දෙයකි. මෙම අන්‍යොන්‍ය අවබෝධය හා සහයෝගය නොමැති වූ විට අතරමං වන්නේ ගොවියා ය. ගොවියා කුමන දෙපාර්තමේන්තුවක් යටතේ ලියාපදිංචි වුව ද ඔහුට අවශ්‍ය වී ඇත්තේ ගොවි ක්ෂේත්‍රයේ ඔහු මුහුණ පා සිටින විවිධ ප්‍රශ්න විසඳා ගත හැකි මාර්ග හා නිෂ්පාදන ශක්තිය වැඩි කර ගෙන ආර්ථිකය නංවා ගැනීමට අවශ්‍ය උපදෙස් ය. ගොවි සංවිධාන කවුරු කොහේ පිහිටුවා ගත්තත් ඒවාට නීත්‍යානුකූල පිළිගැනීමක් අවශ්‍ය නම් පාර්ලිමේන්තු පනතකින් සම්මත වූ ගොවිජන සේවා පනතට අනුකූලව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය ය.

**ගොවි සංවිධානයක් වශයෙන් ලියාපදිංචි වීමෙන් ගොවීන්ට ලබා ගත හැකි ප්‍රතිලාභ කවරේ ද?**

1. අක්කර බදු එකතු කිරීම මගින් ආදායම් තත්ත්වය වැඩි කිරීම.
2. සුළු වාරිමාර්ග කොන්ත්‍රාත් වැඩ බාර ගැනීම
3. ගොවි සංවිධානවල අරමුදල් තර කර ගැනීම හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණයේ දී ගොවීන්ගේ පාලනයක් ඇති වීම
4. කෘෂි රක්ෂණ වාර මුදල් එකතු කිරීම.
5. කෘෂිකර්ම භාරකාර අරමුදල මගින් සේවා සැපයුම් ලබා ගැනීම
6. සහන මිලට ට්‍රැක්ටර් ආදී කෘෂි උපකරණ සේවාවන් ලබා ගැනීම
7. චක්‍රීය අරමුදලෙන් ලැබෙන ප්‍රතිලාභ
8. ලෝක ආහාර වැඩ සටහන යටතේ සුළු වාරිමාර්ග පුනරුත්ථාපනයට සහභාගී වීම හා ඉන් ලැබෙන සහන (1994 වර්ෂයේ සිට)
9. විවිධ සහනාධාර යටතේ ලැබෙන ප්‍රතිලාභ

ගොවි ජනතාව වෙනුවෙන් සකස් වූ, කැප වූ මෙම දෙපාර්තමේන්තුව මගින් ඉහත සේවාවන්වලට අමතරව ගොවීන්ගේ එදිනෙද ප්‍රශ්න, කුඹුරු, වැව, කමත් ප්‍රශ්න, අද ගොවි ප්‍රශ්න, වාරිමාර්ග ප්‍රශ්න සියල්ලම විසඳා ගැනීමට සහාය ලබා දෙයි.

ගොවි ජනතාව වෙනුවෙන් කැප වී ඇති මෙම දෙපාර්තමේන්තුවට තම සේවාවන් සැපයීමට සිදුවී තිබෙන්නේ විවිධ බාධාවන් මධ්‍යයේය. ගොවීන්ගේ කටයුතු සඳහා අවශ්‍ය තරම් මුදල් ලැබේ නම්, විවිධ ගොවි පුහුණු වැඩසටහන් හා සේවා සැපයුම් කටයුතු සඳහා අවශ්‍ය නිලධාරීන්ගේ හිඟය මග හැරවීමට හැකියාවක් ද තිබේ නම්, මීට වඩා විශාලපරිමාණයකින් මෙම සංවර්ධන කටයුතු ඉටු කළ හැකිය. එසේම, නව ව්‍යාපෘති හඳුනා ගැනීමේදී හා විදේශාධාර යටතේ මුදල් වෙන් කිරීමේ දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ගොවීන්ට ඉටුවන කාර්යයන් අරමුණු කොටගෙන අරමුදල් වෙන් වන්නේ නම් හා, මානව සම්පත් සංවර්ධනයට අවස්ථාව ලබා දෙන්නේ නම්, සෑම අංශයකින්ම ගොවි ජනතාවට අවශ්‍ය වන සේවාවන් සැපයීම මෙම දෙපාර්තමේන්තුවට අසීරු කරුණක් නොවේ.

විශේෂයෙන් මෙතෙක් ක්‍රමවත් සංවිධාන ශක්තියක් නොමැතිව සිටි ගොවියාට තමන්ගේ සියලු අයිතිවාසිකම් දිනා ගත හැකි අන්දමට මෙහෙයවිය හැකි ගොවි සංවිධානයක් බිහිවී තිබේ. මේ මාර්ගයෙන් ගොවියාගේ සමාජ ආර්ථික හා දේශපාලන ගැටළු විසඳ ගෙන එක්සත්ව, එක්සිත්ව ගෙන යාමට අවස්ථාවක් යථා කාලයේ දීම උදවනු ඇතැයි අපේක්ෂා කරමි.

**ගොවිජන සේවා කොමසාරිස් කමලනී විජේරත්න මහත්මිය සමග කළ සාකච්ඡාවක් ඇසුරින් සකස් කොට ඉදිරිපත් කළේ.**

**එස්. එම්. කේ. බී. නන්දරත්න**